Department of Wildlife Conservation | No. 811-A, Jayanthipura Road, Battaramulla | Email - dg@dwc.gov.lk | www.dwc.gov.lk

UK International Development
Partnership | Progress | Prosperity

කළමනාකරණය පිළිබඳ සමාලෝචනයක්

පරෙවි දූපත ජාතික උද්‍යානය

ත්‍රිකුණාමලය, නැගෙනහිර වෙරළ

1963 දී සමුද්‍ර අභය භූමියක් ලෙස නම් කරන ලදී.

ඉන්පසු 2003 දී ජාතික උද්‍යානයක් ලෙස නම් කෙරිණි. මෙම පියවරයන් දෙකම ගනු ලැබුවේ වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත (469 අධිකාරිය) යටතේ ය.

විශාලත්වය : වර්ග කි.මී 4.714



එයින් ආරක්ෂා කෙරෙන්නේ මොනවාද?



මෙම ජාතික උද්‍යානය දූපත් දෙකකින් (පරෙවි දූපත සහ කාක දූපත) සහ නොගැඹුරු කොරල් පරයකින් සමන්විත වෙයි. මෙම කොරල් පරය ශ්‍රී ලංකාවේ ඉතාම හොඳින් පවතින පරිසර පද්ධතීන්ගෙන් එකක් වන අතර එහි මත්ස්‍ය විශේෂ 300කට අධික ප්‍රමාණයක්, කැස්බෑවුන් විශේෂ 3ක් සහ බ්ලැක්ටිප් රීෆ් මෝරුන් ඇතුළු සමුද්‍ර ජීවීන් ගණනාවකට නිවහන් වෙයි.

පරෙවි දූපත වටා තැන් තැන්වල කඩොලාන ශාක දැකිය හැකි අතර මෙම දූපතට මෙම නමින් ඇමතීමට හේතු වන වඳවීමේ තර්ජනයට මුහුණ පා සිටින නිල් පොදු පරෙවියා ද ජීවත් වේ.

මෙම ජාතික උද්‍යානය ශ්‍රී ලංකා නැගෙනහිර වෙරළේ ඇති වැදගත් සංචාරක ගමනාන්තයක් වන අතර ප්‍රාදේශීය ජනයාට ජීවනෝපාය අවස්ථාවන් ද සපයයි.

හඳුනාගත් තර්ජන

- විසිතුරු මත්ස්‍ය කර්මාන්තය
- කාලගුණ විපර්යාසය
- සංචාරක කර්මාන්තය
- දූෂණය
- අත්හැර දමන ලද, නැති වූ හෝ ඉවත දැමූ ධීවර ආම්පන්න
- නීති විරෝධී මසුන් ඇල්ලීම
- ආක්‍රමණශීලී ඇල්ගී

ප්‍රධාන සාර්ථකත්වයන්

1. වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ ප්‍රතිපාධන ප්‍රකාරව ප්‍රකාශයට පත් කර ඇත.
2. ප්‍රවේශ බලපත්‍ර, බෝයාවන් යොදා සලකුණු කිරීම සහ විවිධ යාත්‍රා වර්ග සඳහා වර්ණ නියම කිරීම ඇතුළුව සංචාරක කළමනාකරණය සහ කොරල්පර ආරක්ෂා කිරීම සඳහා සක්‍රීය පියවර ගැනීම.
3. ජාතික උද්‍යානය තුළ නීති විරෝධී මසුන් ඇල්ලීම වනජීවී නිලධාරීන් විසින් සැලකිය යුතු ලෙස අඩු කර ඇත.
4. ප්‍රාදේශීය සංචාරක මෙහෙයුම්කරුවන්, කළමනාකරණය සමග ඔවුන්ගේ ඇති නියැලීම සම්බන්ධව සතුටු වන අතර දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහය දක්වයි.
5. ජාතික උද්‍යානයට සැලකිය යුතු සංචාරක ආකර්ෂණයක් ඇති අතර, ජීවනෝපාය අවස්ථා වැඩි කරමින් පුළුල් ප්‍රජාවකට ප්‍රතිලාභ සපයයි.
6. ශ්‍රී ලංකාවේ බොහෝ කොරල් පරවලට වඩා ඉහළ අගයක් ගනිමින් සමස්ත කොරල් ආවරණය 46% ක් වන කොරල් පර සහ කොරල් පර මත්ස්‍ය ගහණය ස්ථාවර සහ යහපත් මට්ටමේ ඇති බවට විශ්වාස කෙරේ.

ආරක්ෂිත ප්‍රදේශයේ කළමනාකරණ ඵලදායිතාව සමාලෝචනය

ආරක්ෂිත ප්‍රදේශයක් නම් කරන විට, එය කෙතරම් හොඳින් කළමනාකරණය වන්නේ ද යන්න අවබෝධ කරගැනීම වැදගත් ය. කළමනාකරණයේ ඵලදායිතාව ඇගයීමට විවිධ ක්‍රම භාවිත කළ හැකි ය. එසේ භාවිත කරන ක්‍රම අතුරින් වඩාත් බහුලව යොදා ගැනෙන්නකි කළමනාකරණ ඵලදායිතා නිරීක්සුම් මෙවලම (METT-4). මෙයට කළමනාකරණ තේමාවන් පහක් වටා පදනම් වුණු ප්‍රශ්න 38කට පිළිතුරු සැපයීම ඇතුළත් වෙයි.

සැලසුම්කරණය
ආරක්ෂිත ප්‍රදේශයට අදාළ නීති සහ සැලසුම්කරණය ඇගයීම.

ආදාන
සම්පත් ඇගයීම; කාර්ය මණ්ඩලය, අයවැය, උපකරණ සහ පහසුකම්

ක්‍රියාවලිය
කළමනාකරණය සිදු කරන ආකාරය ඇගයීම.

ප්‍රතිදාන
කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම ඇගයීම; නිෂ්පාදන/සේවා සැපයීම.

ප්‍රතිඵල
ප්‍රතිඵල සහ ආරක්ෂිත ප්‍රදේශවල අරමුණු කෙතරම් දුරට සාක්ෂාත් කරගනු ලැබුවේද යන්න ඇගයීම.

අප සිදු කළ දේ

සමුද්‍රීය රාජ්‍යයන්ගේ හවුල්කාරිත්ව වැඩසටහන (Ocean Country Partnership Programme - OCPP) සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWC), ලද හැකි සාක්ෂ්‍ය සමාලෝචනය කරමින් සහ නීල සම්පත් භාරය (Blue Resources Trust – BRT) විසින් පහසුකම් සලසන ලද වැඩමුළුවක් සහ රැස්වීම් තුළින් දේශීය පාර්ශ්වකරුවන් 23 දෙනෙකු සමග කටයුතු කරමින් 2024 ජනවාරි 26 වෙනි දින පරෙවි දූපත ජාතික උද්‍යානය ඇගයීමට ලක් කරන ලදී. වඩාත් හොඳින් සිදුවන්නේ කුමක් ද යන්නත් කළමනාකරණය වැඩි දියුණු කිරීමට ගත හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග මොනවාද යන්නත් අපි හඳුනාගෙන ඇත්තෙමු.

පාර්ශ්වකරුවන්

සමාලෝචනය හා සම්බන්ධ අංශ:

- රජය
- රානොසං
- සංචාරක මෙහෙයුම්කරුවන්
- ධීවරයන්
- ප්‍රාදේශීය ප්‍රජාව

කළමනාකරණ සංරචක සඳහා METT ලකුණු ප්‍රමාණය



වාසභූමිය/විශේෂය	තත්ත්වය	ප්‍රවණතාව
කොරල් පරය	යහපත්	ස්ථායී
කොරල් පර මත්ස්‍යයන්	යහපත්	ස්ථායී
කොරල් පර මෝරුන්	යහපත්	වැඩි දියුණු වෙමින් ඇත
පොදු පරෙවියන්	ඇගයුම් කර නැත	ඇගයුම් කර නැත



මීළඟ පියවර

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWC), ඉදිරි කාලයේ ප්‍රමුඛතා නිර්ණය කිරීමට ඇගයීමේ ප්‍රතිඵල භාවිත කරනු ඇත



කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා වන ප්‍රධාන ක්‍රියාමාර්ග

- මීළඟ වසර පහ සඳහා ප්‍රධාන කළමනාකරණ ක්‍රියාමාර්ගයන් දක්වන SMART (නිශ්චිත, මැනිය හැකි, සාක්ෂාත් කරගත හැකි, අදාළ සහ කාල සීමාවක් වෙන් කෙරුණු) කළමනාකරණ සැලැස්මක් සංවර්ධනය කිරීම සහ පාර්ශ්වකරුවන්ගේ ආදාන සඳහා ඉඩ ප්‍රස්ථා සැපයීම.
- ජාතික උද්‍යානයේ අවශ්‍යතා සපුරන පර්යේෂණ සහ අධීක්ෂණ සැලසුමක් සංවර්ධනය කිරීම.
- ජාතික උද්‍යානයේ කළමනාකාරිත්වයට සහය දැක්වීම පිණිස ප්‍රමාණවත් මුදලක් ලැබෙන්නේදැයි සහතික කරගැනීමට සංචාරක ගාස්තු ආදායම වෙන් කිරීම සමාලෝචනය කිරීම.
- ජාතික උද්‍යානයේ සහ ලාවේලි වෙරළේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම (උදා. සනීපාරක්ෂක පහසුකම්, කසල් බඳුන් වැඩි කිරීම, පානීය ජලය, වැඩි වශයෙන් තොරතුරු පුවරු සවි කිරීම).
- ජාතික උද්‍යානය සහ පාරිසරික ගැටළු පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමට සංචාරකයන් සහ ප්‍රාදේශීය ප්‍රජාව සඳහා පවතින අධ්‍යාපන සහ සම්බන්ධතා වැඩසටහන් ගොඩනැගීම.